# මෙත්තානන්ද හඬ අවදි කළ යුතු කාලය එළැඹ ඇත




නැවතත් බෞද්ධ පාසල්වලට කණකොකා හඬන සලකුණු පහළ වී ඇත. බෞද්ධ පාසල්වල මළගම සිදුකරන අනපනත් ක්‍රමයෙන් නැවත කරළියට පැමිණ ඇත. බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදයන් පිළිබඳ ව මහා පරිචයක් තිබූ එල්.එච්. මෙත්තානන්ද ශ්‍රීමතාණන් ගේ අදහස් නැවත විමර්ශනය කිරීමට ඒ අනුව කාලය එළැඹ ඇත.

1894-1967 කාලයේ විසූ එල්.එච්. මෙත්තානන්ද ශ්‍රීමතාණන් එම යුගයේ අද්විතීය අධ්‍යාපනඥයකු විය. අධ්‍යාපනවේදියෙක් ලෙස 1916 දී කළුතර හෝලික්‍රොස් විද්‍යාලයෙන් ආරම්භ කළ තම සේවය කොළඹ ආනන්ද, නාලන්ද සහ මහනුවර ධර්මරාජ යන බෞද්ධ පාසල් තුළ ව්‍යාප්ත කරවී ය. ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පති ලෙස කටයුතු කළ එතුමා 1954 දී විශ්‍රාම යනවිට කොළඹ ආනන්ද විද්‍යාලයේ විදුහල්පතිතුමා ද විය.




එතුමා ගේ මුළු දිවිය ම කැප වුණේ සිංහල බෞද්ධයින් ගේ සුභ සාධනය පිණිස ය. මෙම තේමාව යටතේ ලිපි රාශියක් සම්පාදනය කළ එතුමා 1930-1932 වකවානුවේ දී සැකැසූ "The theory and practise of education as illustrated by the present educational system in Ceylon" (මිල රු. 250/-) යන ග්‍රන්ථයත්, බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදයන් පිළිබඳ සැකැසුණු "මෙත්තානන්ද ලිපි" (මිල රු. 500/-) ග්‍රන්ථයත් නැවත කියවා විමර්ශනය කිරීමට දැන් අවස්ථාව උදා වී ඇත. ශ්‍රී ලංකාවේ ඉතිහාසය මත පිහිටා අධ්‍යාපනය කෙසේ විය යුතුදැයි කියා දෙන මෙම ග්‍රන්ථ දෙක කාලීන වශයෙන් ඉතා වැදගත් වන බැවින් මෙත්තානන්ද ශ්‍රීමතාණන් ගේ කනිටු දියණිය වන ආචාර්ය කමලාදේවී එදිරිවීර මහත්මිය විසින් නැවත 2006 දී මුද්‍රණය කොට ඇත.

මෙම ග්‍රන්ථ ද්විත්වය පහත සඳහන් පොත්හල්වලින් ඔබට ලබා ගත හැක.

- සියලු ම විජිතයාපා පොත්හල්
- එම්.ඩී. ගුණසේන පොත්හල්
- මරදාන සමයවර්ධන පොත්හල
- මරදාන එස්. ගොඩගේ සහ පුත්‍රයෝ පොත්හල
- දයාවංශ ජයකොඩි පොත්හල (මරදාන)
- මාලිගාකන්ද පාරේ මල්පියලි පොත්හල
- බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථාන පොත්හල්

(නැදිමාල, බෞද්ධාලෝක මාවත ශාඛා)

මේ පිළිබඳ සියලු විමසීම්:- තිලක් එදිරිවීර මහතා

දු.අ.:- 0112585005

තොරතුරු සැපයීම - බෞද්ධ බල කේන්ද්‍රය